## විසර්ජන ශීර්ෂය - 275 - පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

**පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගිණුම් පිළිබඳ**

**විගණකාධිපති වාර්තාව**

---

### 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

i. ව්‍යවස්ථාපිත අණපනත් මගින් පැවරී ඇති බලතල හා වගකීම් ඉටු කිරීම .

ii. රජයේ ප්‍රධාන සංවර්ධන වැඩ සටහන් හා සංවර්ධන ව්‍යාපෘති ( සමෘද්ධි හා විමධ්‍යගත වැඩ සටහන් ) රජයේ නියමයන්, උපදෙස් හා මග පෙන්වීම් වලට අනුකූල වන පරිදි ක්‍රියාවට නැංවීම සහතික කිරීම.

iii. දිස්ත්‍රික්කයේ සියළු රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන මගින් ජනතා අභිවෘද්ධිය සඳහා ඉටු කරනු ලබන සංවර්ධන වැඩ සටහන් හා පරිපාලන කටයුතු යථාවත් පරිදි ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සමායෝජනය, සම්බන්ධීකරණය හා මගපෙන්වීම .

iv. ආණ්ඩුවේ දිස්ත්‍රික් නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

v. ස්වභාවික හා වෙනත් ව්‍යසන හා ආපදා ,දිස්ත්‍රික්කය තුල ඇති වූ අවස්ථා වලදී ප්‍රායෝගිකව මැදිහත් වී කටයුතු කිරීම.

### 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල .

i. තමන්කඩුව
ii. හිඟුරක්ගොඩ .
iii. මැදිරිගිරිය
iv. ලංකාපුර
v. දිඹුලාගල
vi. වැලිකන්ද
vii. ඇලහැර

3. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම පිළියෙල කර තිබුණි .

## 4. ගිණුම්

### 4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 07 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 231,675,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 221,991,173 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ශුද්ධ ඉතිරි කිරීම් රු.9,683,827 ක් වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 04 ක් විය . විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 275 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 198,725,000 | 32,950,000 | 189,486,599 | 32,504,574 | 9,238,401 | 445,426 |

### 4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු විසින් පහත සඳහන් පරිදි එකතුව රු. 1,425,987,372 ක් වු ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර, ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශීර්ෂ අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ලැබුණු ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | ඉතිරිය (2010 දෙසැම්බර් 31 දිනට ) |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 103 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 294,275 | 271,650 | 22,625 |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 976,967,351 | 498,292,234 | 478,675,117 |
| 106 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 2,885,876 | 1,851,962 | 1,033,914 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | 985,950 | 632,540 | 353,410 |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය. | 5,037,000 | 5,187,378 | (150,378) |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 7,507,705 | 4,331,713 | 3,175,992 |
| 121 | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 1,795,130 | 1,024,475 | 770,655 |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 2,934,660 | 1,983,496 | 951,164 |

| | | | | |
|---|---|---|---|---|
| 127 | කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 144,000 | 78,243 | 65,757 |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 2,817,391 | 2,293,123 | 524,268 |
| 134 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 42,825 | 41,825 | 1,000 |
| 139 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 1,531,791 | 255,450 | 1,276,341 |
| 145 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය . | 6,612,445 | 5,620,807 | 991,638 |
| 152 | වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය | 1,857,890 | 1,848,659 | 9,231 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 1,134,200 | 146,220 | 987,980 |
| 156 | යෞවන කටයුතු අමාත්‍යාංශය | 1,171,850 | 499,537 | 672,313 |
| 160 | පරිසර අමාත්‍යාංශය | 745,000 | 227,000 | 518,000 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 7,410,905 | 7,057,422 | 353,483 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 9,100 | 9,100 | - |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 8,000 | 8,000 | - |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 1,332,750 | 1,351,829 | (19,079) |
| 217 | පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 1,765,270 | 1,721,709 | 43,561 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 191,368,485 | 186,633,263 | 4,735,222 |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 1,333,115 | 719,700 | 613,415 |
| 226 | ආගමන හා විගමන දෙපාර්තමේන්තුව | 1,815 | 1,710 | 105 |
| 252 | ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 1,444,831 | 921,001 | 523,830 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 187,133,454 | 137,777,189 | 49,356,265 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 189,782 | 189,531 | 251 |
| 284 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 1,329,775 | 445,017 | 884,758 |
| 286 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 15,261,267 | 10,626,766 | 4,634,501 |
| 300 | ආහාර දෙපාර්තමේන්තුව | 2,063,107 | 2,164,938 | (101,831) |
| 307 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | 469,500 | 394,002 | 75,498 |
| 311 | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 400,877 | 268,905 | 131,972 |
| | එකතුව | 1,425,987,372 | 874,876,394 | 551,110,978 |

========== ========= =========

## 4.3 විගණනය හා විගණන විෂය පථය

පොළොන්නරුව දිසත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 දෙසැම්බර් 05 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 4.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 4.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශවල තත්ත්වය මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 4.6 සිට 4.10 දක්වා වූ ඡේදවල ඇතුළත් වෙනත් ප්‍රධාන විගණන නිරීක්ෂණය හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වේ .

### (අ) අයවැය විචලනය

(i) වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් 6% ත් 28 % අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

### (ආ) පොදු තැන්පත් ගිණුම

2010 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම් 02 ක ශේෂයන්ගේ එකතුව රු. 84,779,572 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| ආයතනය | වර්ෂ 2 ට අඩු | වර්ෂ 2 ට වැඩි 05 ට අඩු | වර්ෂ 5 ට වැඩි | 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ------------- | --------------- | ---------------- | --------------- | ------------------ |

| | | | | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| දිසත්‍රික් ලේකම් කාර්යාලය | 16,825,903 | 4,349,989 | 727,608 | 21,903,500 |
| තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 11,407,140 | 43,817 | - | 11,450,957 |
| හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 7,831,244 | 2,106,540 | - | 9,937,784 |
| මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 9,533,376 | 2,209,547 | - | 11,742,923 |
| ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 6,867,540 | 811,148 | - | 7,678,688 |
| දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 7,190,973 | 59,081 | - | 7,250,054 |
| වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 6,452,524 | 82,896 | - | 6,535,420 |
| ඇලහැර ප්‍රාදේශීයලේකම් කාර්යාලය | 7,930,172 | 350,074 | - | 8,280,246 |
| | 74,038,872 | 10,013,092 | 727,608 | 84,779,572 |

(i) ඉහත ශේෂය තුළ මු.රෙ. 571 හි විධි විධාන ප්‍රකාරව කටයුතු කළහැකිව තිබුණු නමුත් එසේ කටයුතු නොකල වර්ෂ 02 කට වැඩි කාල සීමාවක සිට පැවති තැන්පත් ශේෂ වටිනාකම රු.10,740,700 ක් වූ අතර එකී තැන්පතු ශේෂ වලින් වටිනාකම රු. 727,608 ක් වූ තැන්පතු ශේෂ 54 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින ශේෂ බවද නිරීක්ෂණය විය.

(ii) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ නිරවුල් නොකළ ශේෂයන් අතර, ප්‍රදේශයේ විහාරස්ථාන සංවර්ධනය සඳහා 2008 ජනවාරි මාසයේ ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යාංශයෙන් ලබාදුන් රු. 100,000 ක මුදලක් වූ අතර, එම මුදල අදාල කටයුතු වෙනුවෙන් වැයකර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 27501 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ 2010 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එම දින වන විට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු. 2,619,877 ක් ව අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි. විස්තර පහත දැක්වේ.

<u>කාල විශ්ලේෂණය</u>

| | හේතුව | වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 2 ට අඩු | වර්ෂ 2 ට වැඩි 3 ට අඩු | වර්ෂ 3 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. |
| i. | සේවා ස්ථාන මාරුවීම් | - | - | - | 209,870 | 209,870 |
| ii. | මිය යාම් හා විශ්‍රාම ගැනිම | 134,761 | - | - | 568,233 | 702,994 |
| iii | සේවය අතහැර යාම් | 1,800 | 33,837 | - | 49,620 | 85,257 |
| iv. | වැඩ තහනම් වීම | 1,018,548 | - | 271,531 | 213,385 | 1,503,464 |
| v. | වෙනත් | 118,292 | - | - | - | 118,292 |

| | | | | | |
|---|---|---|---|---|---|
| එකතුව | 1,273,401 | 33,837 | 271,531 | 1,041,108 | 2,619,877 |
| | ====== | ======= | ======= | ======== | ======= |

4.6 වත්කම් කළමනාකරණය.

(අ) නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත විග්‍රහ කර ඇති පරිදි සමහරක් වත්කම් නිෂ්ක්‍රීයව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | වත්කම් වර්ගය | ඒකක ගණන හෝ ප්‍රමාණය | කාල පරිච්ඡේදය වර්ෂ 1 ට වැඩි 3 ට අඩු | වර්ෂ 3 ට වැඩි |
|---|---|---|---|---|---|
| (i) | ඇලහැර | වාහන | 01 | - | 01 |
| | | කාර්යාල උපකරණ | 20 | 19 | 01 |
| (ii) | නමන්කඩුව | වාහන | 01 | - | 01 |
| (iii) | හිඟුරක්ගොඩ | වාහන | 03 | - | 03 |
| (iv) | ලංකාපුර | ගොඩනැගිලි | 01 | - | 01 |
| | | වාහන | 01 | 01 | - |
| (v) | දිඹුලාගල | ගොඩනැගිලි | 01 | - | 01 |
| | | | 28 | 20 | 08 |

(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.

අංක පීඑෆ්/සමීක්ෂන මණ්ඩල/01 හා 2010 දෙසැම්බර් 15 දිනැති රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2010 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අදාල කාල රාමුව තුළ සියළු කටයුතු නිමකර 2011 මාර්තු 15 දින ඉදිරිපත් කළ යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 සම්බන්ධව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.7 **අනුකූල නොවීම්**

(අ) **නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම .**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | ආයතනය | අනුකූල නොවීම |
|---|---|---|---|
| | <u>ආයතන සංග්‍රහය</u> | | |
| (i) | xix පරිච්ඡේදයේ 7 වගන්තිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | බදු කාලය ඉක්මවා රජයේ නිවාසයක පදිංචිව සිටින කාල පරිච්ඡේදය වෙනුවෙන්, දණ්ඩන කුලියක් ද අය කළ යුතු වුවද, බදු කාල සීමාව ඉක්මවා නිලධාරීන් පදිංචිව සිටින නිවාස 13 ක් අතරින් නිවාස 11 ක් සඳහා එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) | xix පරිච්ඡේදයේ 5.2.1 සහ 5.6 උප වගන්ති | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | රජයේ නිවාස 04 ක් සඳහා පදිංචි නිලධාරියාගේ වැටුපෙන් 12 1/2% ක නිවාස කුලියක් අය නොකර, සහ රජයේ තක්සේරුකරුගේ වාර්තාවක් නොමැතිව, මසකට රු. 1,400 ත් රු. 750 අතර මාසික කුලියක් 2008 වර්ෂයේ සිට එම නිවාස වෙනුවෙන් අයකරමින් පවතින බව නිරීක්ෂණය විය. |
| (iii) | xiv පරිච්ඡේදයේ 6 වැනි වගන්තිය | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1984 අගෝස්තු 11 දින සිට රජයේ නිවාස 02 ක පදිංචි නිලධාරීන් දෙදෙනෙකුගෙන් නිවාස කුලී අයවී නොතිබුණි. |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | 104 | දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | බෞද්ධ කටයුතු අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණු පරිගණකයේ මධ්‍යම සැකසුම් ඒකකය 2008 ජුලි 21 දින අස්ථානගත වී ඇතත්, ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | චක්‍රලේඛ විධිවිධාන | | |
| (i) | 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර, එයට අනුකූලව 2010 වර්ෂයේ සිට ඉදිරියට, වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කිරීමට උපදෙස් දී ඇතත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2009 අප්‍රේල් 24 දිනැති අංක එල්ඩීයූඑන්/1/3/2/2009 දරන කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | අපි වවමු රට නගමු වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 තුල සාමාජිකයින් 376 දෙනෙකුට රු. 4,700,000 ක ණය මුදලක් වාර්ෂික 5% ක පොලියක් සමඟ වාරික 10 කින් හෝ මාස 10 ක් ඇතුලත ණය මුදල ගෙවා අවසන් කළ යුතු බවත් වාරික මුදල් පැහැර හැරීමේදී එක් මාසයක් සඳහා 5% දඩ මුදලක් වාරිකය සමඟ ගෙවීමටද, අඛණ්ඩව මාස 04 ක් නොගෙවා සිටියහොත් ඇපකරුගෙන් හෝ අයකර ගැනීමට සිදුවන බවද දක්වා ඇතත්, එක් ණය වාරිකයක් හෝ නොගෙවා සිටින සාමාජිකයින් 24 දෙනෙකුගෙන් රු. 31,500 ක ණය මුදලක්ද, මාස හයකටත් වඩා වැඩි කාලයක් හිඟව පවතින 234 දෙනෙකුගෙන් රු. 1,799,300 ක හිඟ ණය ශේෂයක්ද සම්බන්ධයෙන් ඉහත ක්‍රියාමාර්ගවලට එළඹ නොතිබුණි. |
| (iii) | 2010 මැයි 22 දිනැති අංක පීඑෆ්-443 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | රාජ්‍ය ආයතන තම ඉන්ධන අවශ්‍යතා ලබාගැනීමේදී සමුපකාර සමිති සතු ඉන්ධන පිරවුම්හල් වලට ප්‍රමුඛතාවය ලබාදිය යුතු අතර, ඉන්ධන අවශ්‍යතා අනුව අදාල සමූපාකාර සමිතිය වෙත තැන්පත් මුදලක් තබා, එම තැන්පත් මුදලේ ප්‍රමාණය නොඉක්මවීමේ පදනම මත හෝ අත්පිට මුදල් ගෙවා සිය ඉන්ධන අවශ්‍යතාවයන් මිලදී ගතයුතු වුවත්, පුද්ගලික ඉන්ධන පිරවුම්හලක් වෙතින්, සමාලෝචිත වර්ෂය තුල ඩීසල් ලීටර් 8080 ක් සහ පෙට්‍රල් ලීටර් 230 ක් ලබාගෙන තිබුණි. |
| (iv) | අංක 361 හා 1998 අගෝස්තු 14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | රජයේ මුදල් වලින් පුවත්පත් මිලදී ගනු ලබන නිලධාරීන්ගෙන් එකී පුවත්පත්වල වටිනාකමින් 15% ක නාමික අගයක්ද, එක් එක් අංශ වෙනුවෙන් මිලදී ගනු ලබන පුවත්පත් වෙනුවෙන් 10% ක නාමික අගයක්ද, අයකළ යුතු වුවද රු. 11,750 ක් වැය කර මිලදී ගනු ලැබු පුවත්පත් සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (v) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් පිරිනැමීම | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | කිසියම් නිශ්චිත කාලයක් තුල සමිතියක් විසින් ඉටු කරනු ලබන මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට නොවැඩි නොවිය යුතු අතර, දැනටමත් පිරිනමා ඇති කොන්ත්‍රාත්වල මුළු වටිනාකම සහ යෝජිත කොන්ත්‍රාත්තුවේ වටිනාකමේ එකතුව රුපියල් මිලියන 2 ක් නොඉක්මවිය යුතු වුවද එයට පටහැණිව, එක් ප්‍රජා පාදක සංවිධානයකට 2010 නොවැම්බර් 01 දින සිට නොවැම්බර් 11 දින දක්වා දින 10 ක් තුළ රු. 2,940,000 ක් වු කොන්ත්‍රාත් 04 |

| | | | |
|---|---|---|---|
| | | | ක් පිරිනමා තිබුණි. |
| (vu) | 1988 අගෝස්තු 04 දිනැති අංක 359 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | රාජ්‍ය ආයතනවල පවතින ස්ථාවර වත්කම්වල සුරක්ෂිතභාවය තහවුරු වන පරිදි, ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගතයුතු බවට හා ඒවා යාවත්කාලීන කළයුතු බවට උපදෙස් දී ඇති නමුත් නව කාර්යාල ගොඩනැගිල්ල, ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතු ඉඩම, ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |
| (viii) | අංක ඩීඑම්ඒ/2009 (2) සහ 2009 සැප්තැම්බර් 01 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 5 ඡේදය | තමන්කඩුව,ලංකාපුර හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු වත්කම් සම්බන්ධයෙන් වන පිරිවැය, දේපල විස්තර, ඉඩම් ප්‍රමාණය සහ ගොඩනැගිලි ආදියේ වත්මන් වැඩි දියුණු කිරීම් ආදි විස්තර ඇතුළත්, ස්ථාවර වත්කම් ලේඛනයක්, පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

## 4.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව, විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වු අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තුගත මුළු පිරිවැය | ආරම්භ කළ යුතු දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|---|
| | | රු.මිලියන | | |
| මැදිරිගිරිය | 02 | 1.9 | - | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් නැවත ප්‍රතිපාදන පවරා ගැනීම |

### (ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| පාදේශීය ලේකම් කාර්යාලයේ නම | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තුගත මුළු පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2010 දෙසැම්බර් 31 දිනට දරන ලද මුළු වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|---|

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | රු. | | | රු. | |
| මැදිරිගිරිය | 11 | 11,782,741 | 2010.01.11 සිට 2010.10.12 දක්වා | 2010.12.15 | 3,967,807 | අධික වර්ෂාව නිසා |
| ඇලහැර | 11 | 9,260,000 | 2010.11.03 සිට 2010.11.17 දක්වා | 2010.11.16 සිට 2010.12.15 දක්වා | 2,610,254 | වර්ෂාව නිසා |
| තමන්කඩුව | 01 | 686,000 | 2010.11.18 | 2010.12.27 | 145,880 | ගංවතුර ගැලීම සහ අධික වර්ෂාව නිසා |
| හිඟුරක්ගොඩ | 06 | 6,207,740 | 2010.11.24 සිට 2010.12.06 දක්වා | 2010.12.18 සිට 2010.12.26 දක්වා | 435,578 | අයහපත් කාලගුණ තත්වය නිසා ප්‍රතිපාදන ප්‍රමාදවී පැමිණීම |
| ලංකාපුර | 06 | 5,497,348 | 2010.09.12 | 2010.12.12 | 1,657,870 | අයහපත් කාලගුණය |
| දිඹුලාගල | 01 | 844,450 | 2010.11.07 | 2010.12.31 | 3,887,771 | අධික වර්ෂාව |
| | | 34,278,279 | | | 12,705,160 | |

4.9 මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2010 වාර්ෂික ඇස්තමේන්තුව අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සැලසුම් කිරීම සහ කාර්ය සාධනය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පැවරී ඇති කාර්යයන් ඉදිරි වර්ෂවලදී ඉටු කිරීමට සැලසුම් කර ඇති ආකාරය දැක්වෙන සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර, මු.රෙ. 665(1) ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු, පාලන වාර්තා මගින් හෙළිදරව් කර නොතිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පැවරී ඇති මෙහෙවර හා කාර්යයන්, කාර්යක්ෂම ලෙස ඉටුකර ඇති බව, සංඛ්‍යා ලේඛන මගින් තහවුරු වී නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු.

(i) ගැලපුම් කළ යුතු ශේෂ.

2010 දෙසැම්බර් මාසය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු, ගැලපුම් පිළිබඳ විග්‍රහයකට අනුව, අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලපුම් පිළිබඳ විස්තර | මාස 6 - 12 | අවු. 1-3 | එකතුව |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (අ) | උපලබ්ධි නොවු තැන්පතු | 335,172,017 | 179,053 | 335,351,070 |
| (ආ) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් | 570,700,128 | 1,086,230 | 571,786,358 |
| (ඇ) | හඳුනා නොගත් හර | 50,419,516 | 1,615 | 50,421,131 |
| (ඈ) | හඳුනා නොගත් බැර | 100,851,289 | 13,286 | 100,864,575 |
| | | 1,057,142,950 | 1,280,184 | 1,058,423,134 |

(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා.

(i) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ආපන ශාලාව ටෙන්ඩර් කර සැපයුම්කරුවෙකු තෝරාගෙන ඇතත්, විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණු අතර, පසුව වෙනත් පුද්ගලයෙකු විසින් ගිවිසුමකින් තොරව ආපන ශාලාව පවත්වාගෙන ගොස් තිබුණි. ආපන ශාලාවෙන් ලැබෙන රු. 4,000 ක මාසික කුලී මුදල රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණු අතර, අලෙවි කරන ආහාරපාන වල මිල ගණන් පාරිභෝගිකයින්ගේ දැනගැනීම සඳහා ප්‍රදර්ශනය කර නොතිබුණි.

(ii) ජනාධිපති කාර්යාලයේ මානව ආපදා කළමනාකරණ සභාව විසින් 2005 නොවැම්බර් 28 දින ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා පානීය ජල ව්‍යාපෘතියක් වෙනුවෙන් ලබාදී තිබුණු රු. 2,400,000 ක මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වෙප්පම්පුර පානීය ජල ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබුණු අතර, 2011 මාර්තු මාසය වන විටද, අදාල ව්‍යාපෘතියේ වැඩ නිමකර නොතිබීම නිසා රු. 1,750,909 ක මුදලක් වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ නිෂ්ක්‍රියව තිබුණි.

(iii) රු. 517,211 කට ඇස්තමේන්තු කරන ලද සෝමපුර, උස්සාන ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා 2007 ජුලි 25 දින සෝමපුර, ග්‍රාමීය සමෘද්ධි බලකාය සමඟ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් විසින් ගිවිසුම් අත්සන් කර ඇතත්, 2011 මාර්තු මාසය වන විටද අදාල ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

(iv) 2005 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගත් රු. 49,654 ක් වටිනා පුස්තකාල පොත්, කබඩ්, ප්ලාස්ටික් පුටු, වයර් කෝඩ්, හා දැන්වීම් පුවරු ආදී භාණ්ඩ 2011 මාර්තු මාසය වන විටද, අදාල ප්‍රතිලාභීන් වෙත බෙදාහැර නොතිබුණි.

(v) ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ල හා කාර්යාලය සතු අනෙකුත් ගොඩනැගිලි, මහවැලි සංවර්ධන අධිකාරිය සතුව පවතින අක්කර 02 ක භූමි භාගයක කලක සිට පවත්වාගෙන යන නමුත්, එකී භූමි භාගය හා ගොඩනැගිලි වල අයිතිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරා ගෙන නොතිබුණි.

(vi) 2010 වර්ෂයේදී ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 05 කදී රු. 1,301,683 ක් වූ මිලදී ගැනීම් සම්බන්ධයෙන්, ප්‍රසම්පාදන මණ්ඩල හා තාක්ෂණ කමිටු ක්‍රියාකාරීත්වයකින් තොරව සිදුකර තිබුණි.

(vii) 2010 වර්ෂය තුල විමධ්‍යගත අයවැය යටතේ පාසල් 02 ක් සඳහා රු. 142,500 ක් වැයකර සංගීත උපකරණ මිලදී ගැනීමත්, රු. 70,000 ක් වැයකර නැටුම් ඇඳුම් කට්ටල මිලදී ගැනීමත් ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු අතර, එම මිලදී ගැනීම් වෙනුවෙන් මිල ගණන් ලබාගෙන නොතිබුණි.

(viii) ඇලහැර ප්‍රාදේශීය සභාවට උපකරණ ලබාදීම සඳහා දිස්ත්‍රික් විමධ්‍යගත අයවැය යටතේ රු. 50,000 ක මුදලක් ලබාදී තිබුණු අතර, එම කටයුත්ත ඇලහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටු නොකර, එම මුදල චෙක්පතක් මගින් ප්‍රාදේශීය සභාවට නිදහස් කර තිබුණි.

(ඇ) පාඩු හා හානි.

---------------

(i) නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් පරිදි පාඩු හා හානි සිදුවූ අවස්ථා නිරීක්ෂණය විය.

- 2010.04.04 දින ජීප් රථයේ අනතුර - රු. 146,159
- 2010.07.25 දින කැබ් රථයේ අනතුර - රු. 230,000
- 2010.06.15 දින කැබ් රථයේ අනතුර - රු. 99,466

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නඩත්තු කර තිබුණු හානි ලේඛනය අනුව, පොතෙන් අස් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමකින් තොරව දිගින් දිගටම පවතින, අවස්ථා 09 කදී සිදුවී තිබුණු පාඩු හා හානිවල එකතු වටිනාකම රු. 5,520,806 ක් වන බව නිරීක්ෂණය විය.

4.9 මානව සම්පත් කළමනාකරණය.

----------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු.

---------------------------------------

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. | ජ්‍යෙෂ්ඨ මට්ටම | 26 | 21 | 05 |
| ii. | තෘතීය මට්ටම | 14 | 13 | 01 |
| iii. | ද්විතීය මට්ටම | 527 | 419 | 108 |
| iv. | ප්‍රාථමික මට්ටම | 97 | 77 | 20 |

| | | | |
|---|---|---|---|
| එකතුව | 664 | 530 | 134 |

4.10 අභ්‍යන්තර පාලනය.

(අ) ලේඛන තබා ගැනීම.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණනය.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබෙන නමුත් මුදල් රෙගුලාසි 134 ප්‍රකාරව යෝග්‍ය විගණන වැඩ සටහනක් පිළියෙල කර නොතිබුණු අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණනයට අදාල අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් වී නොතිබුණි.